**උතුරු නැගෙනහිර පළාත්බද සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (උනැපසේවැව්‍යා) - 2014**

---

උතුරු නැගෙනහිර පළාත්බද සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (උනැපසේවැව්‍යා) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර එළඹි 2009 නොවැම්බර් 08 දිනැති අංක 4728 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ II බී වගන්තියේ 2 උපලේඛනය සහ 2014 මැයි 08 දිනැති අංක ටීඑෆ් 013787 දරන ප්‍රදාන ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

මූල්‍ය ගිවිසුමට හා ප්‍රදාන ගිවිසුමට අනුව ව්‍යාපෘතිය, එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ගිණුම් කටයුතුභාවය හා වගකිව යුතු ආකාරයෙන් ශ්‍රී ලංකාවේ උතුර, නැගෙනහිර, උතුරු මැද, වයඹ, ඌව පළාත්වල පළාත් පාලන ආයතනවලින් සැපයෙන දේශීය යටිතල පහසුකම් සේවා වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. මූල්‍ය ගිවිසුමට හා ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 11,997.50 කට සමාන එජඩො මිලියන 106.30 ක් වන අතර ඉන් රු.මිලියන 5,500 කට සමාන එජඩො මිලියන 50 ක ණය සහ රු.මිලියන 2,537.5 කට සමාන එජඩො මිලියන 20.30 ක ප්‍රදාන ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යායනය කිරිමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 මැයි 01 ආරම්භ කළ අතර 2015 දෙසැම්බර් 31 අවසන් කිරිමට නියමිත විය.

**1.3 ව්‍යාපෘති ක්‍රියාකාරකම්**

---

සංරචක 05 ක් යටතේ සිදු කිරීමට උපලේඛනගත ව්‍යාපෘති ක්‍රියාකාරකම් පහත සාරාංශ කර ඇත.

**සංරචකය 1 : යටිතල පහසුකම් සේවා බෙදාහැරීම**

යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු සිදු කිරීමට හැකිවන පරිදි පළාත් පාලන ආයතනවලට ප්‍රදාන සැපයීම.

**සංරචකය 2 : ගිණුම් කටයුතුභාවය ආයතන ගත කිරීම**

විනිවිදව හා ස්වාධීනව වාර්ෂික මූල්‍ය විගණනය, සමාජ හා තාක්ෂණික විගණනය සිදු කිරීමටත්, ප්‍රමාද වූ මූල්‍ය ප්‍රකාශන හා විගණන නිරීක්ෂණ නිරවුල් කිරීමටත් හැකිවන පරිදි පළාත් පාලන ආයතනවලට තාක්ෂණික සහාය ලබා දීම පළාත් පාලන ආයතනවල මෙහෙයුම් වැඩිදියුණු කිරීමට පද්ධති හා පරිපාටි අධ්‍යයනයක් සහ සන්නිවේදන ප්‍රචාරණයත්, සංවර්ධනයත් හඳුන්වා දීම.

**සංරචකය 3 : ධාරිතා වර්ධනය**

කාර්යක්ෂමව හා කාලීනව විගණනයන් සිදු කිරීමට පළාත් පාලන ආයතනවල සැලසුම්, අයවැය, මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදනය හා ව්‍යාපෘති කළමනාකරණ ක්ෂේත්‍රයන්හි ධාරිතාව ඉහළ නැංවීම මෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ හැකියාවන් සවිබල ගැන්වීම.

**සංරචකය 4 : තක්සේරු කිරීම හා අගය කිරීම**

පළාත් පාලන ආයතනවල කටයුතු නියාමනයට විස්තීර්ණ පද්ධතියක් ඇති කිරීම හා පළාත් පාලන ආයතන වල මෙහෙයුම් ඇගයීම හා විශ්ලේෂණය කිරීම.

**සංරචකය 5 : ව්‍යාපෘති කළමනාකරණය**

ව්‍යාපෘති කළමනාකරණ ඒකකවල ධාරිතාව සවිබල ගැන්වීම.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.5 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක  කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරික්ෂා කිරීම්ද පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ  සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ දායකත්ව නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය හා ප්‍රදාන යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය හා ප්‍රදාන යටතේ කරන ලද ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ හා ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) මූල්‍ය ගිවිසුමේ හා ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඊ) ණය හා ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) විශේෂ ඩොලර් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී.ලං.ම.බැ.) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(එ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(ඔ) මූල්‍ය ගිවිසුමේ හා ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

### 1.6 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

----------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ ඩොලර් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී.ලං.ම.බැ.) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමේ හා ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ

(ඊ) මූල්‍ය ගිවිසුමේ හා ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

ඉදිරිපත් කළ තොරතුරු අනුව, පළාත් පාලන ආයතන 79 ක් විසින් එකී පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා මුදාහළ රු.මිලියන 3,300 කින් රු. මිලියන 2,585 ක් පමණක් 2014 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. කෙසේ වෙතත් ලබා දුන් සම්පූර්ණ මුදල දැරූ පිරිවැය ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.2.2 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

-----------------------------------------

පහත අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ගිවිසුමේ උප ලේඛන 2 හි 1.3.4 වගන්තිය අනුව, සකස් කළ යුතුව තිබූ සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ඇස්තමේන්තුව ව්‍යාපෘතිය විසින් සකස් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 461.99 ක සිවිල් වැඩ හා භාණ්ඩ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන්, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 364(3) හී අවශ්‍යතාවයන්ට අනුව එකතු කළ අගය

මත බදු වෙනුවෙන් වූ විස්තරාත්මක වාර්තාවක් දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) උතුරු පළාතේ ව්‍යාපෘති කාර්යාලය විසින් මුදල් රෙගුලාසි 138 ප්‍රකාරව එකතුව රු.මිලියන 119.89 ක ගෙවීම් වවුචර හතක් සමාලෝචිත වර්ෂය තුළදී සහතික කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යනය හා සමාලෝචිත වර්ෂය තුළදි හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය හා ප්‍රදාන ගිවිසුම් අනුව මූල්‍යයනය කිරිමට එකඟ වූ මුදල | | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො. (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) |
| ණය | 50.00 | 5,500.00 | 12.34 | 1,608.97 | 49.91 | 6,185.00 |
| ප්‍රදාන | 20.30 | 2,537.50 | 8.05 | 1,167.69 | 8.08 | 1,167.69 |
| ශ්‍රී.ලං.ර. | 34.00 | 3,740.00 | 0.61 | 67.66 | 14.06 | 1,546.57 |
| ප්‍රජා දායකත්වය | 2.00 | 220.00 | 2.71 | 298.82 | 4.64 | 510.35 |
| | **106.30** | **11,997.50** | **23.71** | **3,143.14** | **76.69** | **9,409.61** |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා වෙන් කළ එ.ජ.ඩො. මිලියන 20.30 ක ප්‍රදාන අතුරින් එ.ජ.ඩො. මිලියන 8.08 ක් පමණක් 2014 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි.විස්තරාත්මක සැලැස්මක් නොතිබීම හේතුවෙන් ඉතිරි වසර 01 ක කාලපරිච්ඡේදය තුළ එ.ජ.ඩො. මිලියන 12.22 ක ඉතිරි මුදල් උපයෝජනය කළ හැකිද යන්න සැකසහිත විය.

(ආ) ඉදිරිපත් කළ තොරතුරු අනුව, තක්සේරු කිරීම හා ඇගයීම් කාර්යයන් සඳහාත්, පළාත් පාලන ආයතන වල ගිණුම් කටයුතුභාවය පිළිබඳ රාමුව ආයතන ගත කිරීම සඳහාත් පිළිවෙලින් රු. මිලියන 40.5 ක හා රු. මිලියන 43.5 ක වෙන්කිරීම් අතුරින් රු. මිලියන 14.10 ක් හා රු. මිලියන 22.47 ක් පමණක් 2014 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

-----------------

රැස්කළ තොරතුරු අනුව, පළාත් පාලන ආයතන 79 ක ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු. මිලියන 9,950 කට සමාන එකතුව එ.ජ.ඩො. මිලියන 90 ක් වෙන් කර තිබුණු අතර සිදු කළ වැඩ වල භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| සංවර්ධන කාර්යය | 2014 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත ප්‍රගතිය | 2014 දෙසැම්බර් 31 දිනට සාක්ෂාත් කරගැනීම | සාක්ෂාත් කරගැනීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| පිවිසුම් මාර්ග සංවර්ධනය | | | |
| -තාර යෙදීම | කිලෝමීටර 865 | කිලෝමීටර 379 | 43 |
| -කොන්ක්‍රීට් කිරීම | කිලෝමීටර 135 | කිලෝමීටර 259 | 191 |
| උද්‍යාන/වෙළඳ පොල ඉදිකිරීම සහ කුඩා නගර සංවර්ධනය | ඒකක 405 | ඒකක 171 | 42 |
| මළ/ජලාපවාහන | කිලෝමීටර 245 | කිලෝමීටර 41 | 16 |
| අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතිය | ඒකක 66 | ඒකක 01 | 1.5 |
| ග්‍රාමීය ජල සැපයුම් පද්ධති | ඒකක 439 | ඒකක 22 | 0.5 |
| ග්‍රාමීය විදුලිජනනය | කිලෝමීටර 187 | කිලෝමීටර 23 | 12 |

සිදු කිරීමට ඇති ඉතිරි වැඩ හා සම්පූර්ණ කළ යුතු වැඩ සඳහා ඇති කාලය සැසඳීමේදී ව්‍යාපෘති කාලය තුළ ව්‍යාපෘතියේ අරමුණු ලගා කර ගැනීමට ඇති හැකියාව සැක සහිතය.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) මිල ඉදිරිපත් කළ ලංසු ලියකියවිලිවල ප්‍රකාශිත රේට් ගණන් පසුව වෙනස් කර තිබුණු බවත්, ඒ මත කොන්ත්‍රාත්කරුට රු. මිලියන 4.42 ක් ගෙවා තිබුණු බවත් උතුරු පළාතේ වැල්වැටිතුරෙයි නගර සභාව, වව්නියාව දකුණ සිංහල ප්රාදේශීය සභාව, කරෙයිනගර් ප්‍රාදේශීය සභාව විසින් සිදු කළ මාර්ග 04 ක ප්‍රතිසංස්කරණ වැඩවල ගෙවීම් සම්බන්ධයෙන් සිදු කළ විගණන නියැදි පරික්ෂාවේදී අනාවරණය වී තිබුණි.

(ආ) වව්නියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාව විසින් සිදු කරන ලද ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් වැඩ සඳහා ලංසුකරුවන් තෝරා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපති ලෙස ව්‍යාපෘති ඉංජිනේරු කටයුතු කර තිබුණු බවත්, ඔහුට අයත් සමාගමට එම කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණු බවත් නිරීක්ෂණය විය.

(ඇ) මැනැන්දිහී වෙළඳපල හා සාප්පු සංකීර්ණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ අමතර වැඩ වෙනුවෙන් අදාල බලධාරීන්ගෙන් විචලතා නියෝග සඳහා අනුමැතිය ලබා නොගෙන රු. මිලියන 1.14 ක් ගෙවා තිබුණි. මැනැන්දී වෙළඳපලෙහි කොන්ත්‍රාත් වැඩ ණය ගිවිසුමේ ප්‍රතිපාදනයන්ට පටහැනිව උප කොන්ත්‍රාත්කරුවන් වෙත පිරිනමා තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඈ) රු. මිලියන 11.5 ක පිරිවැයකට පිරිනමන ලද 2012 අප්‍රේල් 10 දින වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂිත ඉලාක්කායිතුරෙයි ප්‍රධාන මාර්ගයේ සිට පුන්නියාඩිෂෙට්ටි මාර්ගය දක්වා මාර්ගය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත්කරුගේ අඩුපාඩු හේතුවෙන් අත්හිටුවා තිබුණි. කෙසේ වෙතත් නැගෙනහිර පළාතේ වෙරුගල් ප්‍රාදේශීය සභාව විසින් අත්තිකාරම් බැඳුම්කරය මුදල් කර ගැනීම මගින් රු. මිලියන 2.3 ක අත්තිකාරම් වටිනාකම අයකර ගැනීමට කිසිදු කාලීනව පියවරක් ගෙන නොතිබුණි. තවද, කොන්ත්‍රාත්තුව අත්හිටුවීම හේතුවෙන් කාර්ය සාධන බැඳුම්කරයද මුදල් කර ගෙන නොතිබුණි.

(ඉ) එසේම, රු. මිලියන 17.6 ක පිරිවැයකට මාස 3 කින් සම්පූර්ණ කිරීමට 2012 අප්‍රේල් 03 දින පිරිනමන ලද පුන්නියාඩිෂෙට්ටි මාර්ගයේ ප්‍රතිසංස්කරණය සඳහා වූ කොන්ත්‍රාත්තුවද වැඩ ආරම්භ කිරීමට අපොහොසත්වීම නිසා අත්හිටුවා තිබුණි.කෙසේ වෙතත් රු. මිලියන 3.53 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම හා කාර්ය සාධන බැඳුම්කරය එකී බැඳුම්කරවල කල් ඉකුත් වන විටත් මුදල් කර ගෙන නොතිබුණු අතර වගකිවයුතු නිලධාරියාට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 3.4 නිෂ්කාර්යය/ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

මුතූර් ප්‍රාදේශීය සභාව හා ත්‍රිකුණාමලයේ වෙල්ලෙයිමනාල්හී සාප්පු සංකීර්ණයේ සාප්පු 27 ක් අදාල කාර්ය සඳහා භාවිතා කිරීමට කටයුතු නොකර වසර 03 කට වැඩි කාලයක් නිෂ්ක්‍රීයව තිබුණු බව නිරීක්ෂණය විය.

## 3.5 පෙර විගණන වාර්තාවල පෙන්වා දෙන ලද විසඳි නොමැති විගණන නිරීක්ෂණ

----------------------------------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු අනුව එකතුකළ අගය මත බදු ගෙවීම් සඳහා ලියාපදිංචිවීමේ වලංගුතාවය තහවුරු කර ගැනීමකින් තොරව නගර සභාවක හා ප්‍රාදේශීය සභා 09 ක අවස්ථා 19 කදී ඉදිකිරීම් වැඩ සිදු කිරීමේ නියුතු කොන්ත්‍රාත්කරුවන්ට වටිනාකම රු. මිලියන 16.2 ක එකතුකළ අගය මත බදු ගෙවා තිබුණි. ගෙවීම් සම්බන්ධ අදාල පාර්ශවයන් ගෙන් අයකර ගැනීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ප්‍රමාණවත් කටයුතු සිදු කර නොතිබුණි.